ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේ දී, නාලන්දා හා විලව්චිය වතු ලියාහැරීම යටතේ රු.32,908ක් අඩුවෙන් ද, නව රෝපණ ආයෝජනය රු.56,611ක් වැඩියෙන් ද,වෙනත් සුළු ව්‍යාපෘති ආයෝජනය රු.145,740ක් වැඩියෙන් ද වෙනස්කම් පැවතීම හේතුවෙන් සමස්ත ලෙස රු.235,259 ක වෙනසක් විගණනයට නිරීක්ෂණය විය.	එකඟ වෙමි. මේ යටතේ සඳහන් නාලන්දා හා විලව්චිය වතුයායන් ලියාහැරීම්, නව රෝපණ සඳහා ආයෝජනය හා වෙනත් සුළු ව්‍යාපෘති සඳහා ආයෝජන යන ගැලපීම් සම්බන්ධයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අදාල නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේදී නිවැරදි අගයන් භාවිත කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 වැනි ඡේදය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ සම්බන්ධයෙන් සිදුකර ඇති ප්‍රත්‍යාගණනයේදී, එකම කාණ්ඩයට අයත් වත්කම් සියල්ලම එකවර ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් මෝටර් රථ 28 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන විගණනයට ලබා දුන් පසු ප්‍රත්‍යාගණන කළ මෝටර් වාහන 06 ක ප්‍රත්‍යාගණන ප්‍රතිඵල ගිණුම්ගත කළයුතුව පවතී.තවදුරටත් ප්‍රත්‍යාගණනය සිදුකළයුතු මෝටර් වාහන සංඛ්‍යාව 22 කි. ඒවායින් ඉතා පැරණි වාහන 08 ක වැසි අංක අපැහැදිලි තත්ත්වයක් හේතුවෙන් එම වාහනවල ප්‍රත්‍යාගණන කටයුතු සිදුකළ නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට 2025.04.22 වන දින ලිඛිතව දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇත. ප්‍රත්‍යාගණන කටයුතු සඳහා අදාල ප්‍රදේශයන් හි මෝටර් රථ තාක්ෂණ නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට ප්‍රායෝගිකව සැලකිය යුතු කාලයක් ගතවන බැවින් ඉතිරි මෝටර් වාහනවල ප්‍රත්‍යාගණන කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකිවී ඇති අතර, එම කටයුතු ද හැකි ඉක්මණින් නිම කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව,එකම කාණ්ඩයට අයත් වත්කම් සියල්ලම එකවර ප්‍රත්‍යාගණනය කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 77 ඡේදය අනුව වර්ෂය තුළ සිදු කරන ලද රු. රු.159,475,000ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ වූ හෙළිදරව් කිරීම් සිදු කර නොමැති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ සටහන්වල ප්‍රත්‍යාගණන කිසිවක් නොමැති බව සඳහන් වී තිබුණි.	කළමණාකරණය අදහස් දක්වා නැත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව, වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය.

(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.44,648,405ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති ස්ථාවර වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.	කළමනාකරණය අදහස් දක්වා නැත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීම කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ රු.51,175,852ක ශේෂයට අනුරූපීව ආයෝජනයක් සිදු කර නොතිබුණි. ප්‍රවර්තන වර්ෂය තුල විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් සඳහා ආයෝජනයක් ලෙස මාසිකව රු.100,000ක මුදලක් ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම ආරම්භ කර තිබූ අතර එහි 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.502,223 ක් විය.	මෙහි සඳහන් පරිදි දැනට සංස්ථාව සතුව පවතින මූල්‍ය ප්‍රතිපාදනවලට අනුව විශ්‍රාමික පාරිතෝෂික වෙන් කිරීම් සඳහා රු.100,000 ක මුදලක් මාසිකව ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබේ.කෙසේ වෙතත් ඉදිරියේදී සංස්ථාවේ මූල්‍යමය තත්ත්වය සලකා බලා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව විශ්‍රාමික පාරිතෝෂික වෙන් කිරීම් සඳහා මාසිකව සිදුකරනු ලබන ආයෝජනය රු.200,000 ක් දක්වා ඉහළ නැංවීමට සහ එම මුදල තවදුරටත් ක්‍රමිකව ඉහළ නැංවීමට අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පාරිතෝෂික වගකීම් පියවීම සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් ඇති කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව තොග පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කර තිබුණ ද,ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය භාවිතා කරන බව මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන්ව තිබුණි.	ආයතනයේ තොග පිරිවැය හඳුනා ගැනීම සඳහා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමයට සාපේක්ෂව බර තැබූ සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය වඩා තර්කානුකූල බවට තීරණය කළ හෙයින් ඒ අනුව එම ක්‍රමය යටතේ තොග පිරිවැය ගණනය කරන ලද අතර, ඒ අනුව ඊට අනුරූපව මූල්‍ය ප්‍රකාශනවල තොග අගය කිරීමට සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදිව ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව තොග පිරිවැය ගණනය සඳහා පිරිවැය ක්‍රම භාවිතා කළ යුතුය.
(උ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 ප්‍රකාරව වෙළඳ ණයගැතිය සඳහා අලාභ වෙන් කිරීමට, ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය අලාභය (Lifetime Expected Credit Loss –ECL) පදනම් කරගනිමින් සරල කළ ආකෘතිය (Simplified Approach) යොදාගත යුතු වුවද සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශන දිනට ඇති මුළු වෙළඳ ණයගැති ශේෂය මත සියයට 5ක් ලෙස පොදු වෙන් කිරීමක් සිදු කර තිබුණි.	කළමනාකාරිත්වය පිළිතුරු සපයා නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය අලාභය පදනම් කර වෙළඳ ණයගැතියන් සඳහා අලාභ වෙන් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේදී නාලන්දා වතුයාය ශ්‍රී ලංකා කෘෂි සංස්ථාවේ පාලනයෙන් ඉවත් කර ඇතත් කෙරී ගෙන යන වැඩ යටතේ ඇති රු.793,092 ක වටිනාකමින් යුතු නාලන්දා කාර්යාල නිල නිවාසයෙහි වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.	එකඟ වෙමි. මෙහි සඳහන් පරිදි නොනිමි වැඩ යටතේ ඇතුළත්ව ඇති රු.793,092 ක නාලන්දා කාර්යාල නිල නිවසෙහි ඉදිකිරීම් පිරිවැය ඉන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ආයතනයට අයත් නොවූ වත්කම් ඉවත්කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්කර 1,586ක් සහ රූඩ් 2ක් සහ පර්චස් 24ක් විශාල වතු 7 ක් සංස්ථාව විසින් පරිහරණය කිරීම වෙනුවෙන් 1999 සිට 2009 කාලපරිච්ඡේදයට අදාළව එම සභාව වෙත ගෙවිය යුතු රු.1,357,791ක් සහ 2010 සිට 2024 වර්ෂය දක්වා එම සභාවට අයත් අක්කර 1,874ක් විශාල ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳීම හේතුවෙන් බදු ලෙස එම සභාවට ගෙවිය යුතු මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සඳහා ගෙවිය යුතු බදු මුදල් සඳහා වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැත්තේ අදාල ඉඩම්වල මැනුම් කටයුතු සඳහා නියෝග ලබාදීමේදී මතුවී ඇති ගැටළු එම කොමිෂන් සභාව මඟින් මේ වනවිටත් නිරාකරණය කරදී නොමැති බැවිනි. අදාල ගැටළු නිරාකරණය කර ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඉදිරියේදී පැවැත්වීමට නියමිත සාකච්ඡාවෙන් පසුව අදාල ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව සංශෝධිත ගෙවිය යුතු බදු මුදල මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ආයතනය පරිහරණය කරන ඉඩම් වලට අදාල බදු ගණනය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු විගණන ගාස්තුව වූ රු.1,331,040 මූල්‍ය ප්‍රකාශනවල රු.531,298ක් ලෙස එනම් රු.799,742ක් අඩුවෙන් දක්වා තිබුණි.	පිළිගෙන ඇත.	ගෙවිය යුතු විගණන ගාස්තුව නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2011 වර්ෂයේ සිට ආදායම් බදු ගණනය කොට වෙන් කිරීම් සිදු කිරීමට, ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබුණි.තවද, අයකර ගත නොහැකි රඳවාගත් බදු (WHT) රු.779,483ක් මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කර තිබුණි.	2023/2024 වර්ෂයට අදාලව සංස්ථාවේ ආදායම් බදු ප්‍රකාශන මාර්ගගත ක්‍රමය මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට තීරණය වූ ඉදිරි කෙටිකාලයක් ඇතුළත අදාල බදු ප්‍රකාශන යැවීමේ කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. අනෙකුත් වර්ෂ සඳහා ද අදාල ඉදිරි තීරණ පරිදි ආදායම් බදු ප්‍රකාශන යැවීමට කටයුතු කරනු ලැබේ.	ආදායම් බදු ගණනය කොට වෙන් කිරීම් සිදු කිරීමට,ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාව විසින් එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට මීට වසර 11 කට පෙර රු. 9,466,200ක කඡු පැළ ලබා දී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් වෙනත් ණයගැති ශේෂය තුළ ඇති එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිකම නිරීක්ෂණය විය.	මෙම මුදල අයකරවා ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් ලබාදී ඇති ලිඛිත උපදෙස්වලට අනුව අදාල ණය මුදල් අයකරවා ගැනීමට පවතින එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති දිවිනැඟුම දෙපාර්තමේන්තුවේ විෂයය වර්තමානයේදී ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත පැවරී ඇති බවට දන්වා ඇති හෙයින් විෂයගත කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරවා ගැනීම සඳහා එම අමාත්‍යාංශය වෙත ලිපියක් යැවීමට කටයුතු කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. ඒ අනුව ඊට අදාලව 2025.06.27 දිනැති සිහිකැඳවීම් ලිපියක් අදාල අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර ඇත. ඊට අනුරූපව ලැබෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	ලැබිය යුතු ගිණුම් ශේෂ නොපමාව නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සංස්ථාවේ වෙළඳ ණයගැති ශේෂය තුළ වර්ෂ 1ත් 2ත් අතර රු.1,670,356ක් ද, වර්ෂ 2 ඉක්ම වූ රු.2,676,845ක ණයගැති ශේෂ ඇතුළත්ව තිබූ අතර ණය නොගෙවූ ආයතන වෙත ණය පියවීමට පෙර නැවත ණයට කඡු නිකුත් කර තිබුණි. ඒ අනුව ණය පදනම මත අලෙවි කිරීම හා ණය අයකර ගැනීමට අදාලව සංස්ථාවේ අභ්‍යන්තර පාලනය දුර්වල බව නිරීක්ෂණය විය.	2024 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබෙන වරලත් හා වරලත් නොවන ණයගැති ශේෂවල සමස්ත එකතුව වූ රු.9,401,878 ක අගයෙන් 2025.06.30 දින වන විට රු.4,432,047 ක් අයකරවා ගැනීමට කටයුතු කර ඇත. ඉහත දිනට තවදුරටත් අයකරවා ගැනීමට පවතින රු. 4,969,831 ක අගයෙන් ඉහළම ණයගැති ශේෂය වන රු.1,454,410 ක මුදල,ලිසල එන්ටර්ප්‍රයිසස් ආයතනය මගින් අයකර ගැනීමට පවතින අතර, මේ සම්බන්ධයෙන් දිගින් දිගටම එම ආයතනය වෙත සිදුකරන ලද දැනුම්දීම්වලට ප්‍රතිචාර නොමැති බැවින් එම ණය මුදල අය කර ගැනීම සඳහා මේ වන විට නෛතික ක්‍රියාමාර්ගවලට ප්‍රවේශ වී ඇත.එසේම අනෙකුත් ණයගැතියන්ගේ ණයගැති ශේෂ තහවුරු කිරීම් ගෙන්වා ගැනීම සඳහා ලිපි යවා ඇති අතර,ඒ අනුව එම ණයගැති ශේෂ ද අයකරවා ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ලෙලි කජු මිලදී ගැනීම සඳහා 2005 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක් හා ඊට අදාළ පොලිය වන රු. 927,500 ක මුදල සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. සංස්ථාවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.9,466,200 ක මුදල ලැබුනු පසු, වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව විසින් ලබාගෙන ඇති රු.3,500,000 ක ණය මුදල හා ඊට අදාල පොලී මුදල ගෙවීමට කටයුතු කරනු ලැබේ.	ගෙවිය යුතු ගිණුම් ශේෂ නොපමාව නිරවුල් කළ යුතුය.

1.6.3 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අංක 371(2) යටතේ සඳහන් විධිවිධානවලට අනුව, රජයේ නිළධාරීන් විසින් රාජකාරි කටයුතුවලට අදාළව ලබා ගන්නා අත්තිකාරම් මුදල් (තත්කාර්ය අතුරු අග්‍රිම), එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළයුතු බවට සඳහන්ව පැවතියද, 2024 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද වටිනාකම රු.617,000 ක් වූ අවස්ථා 9 ක් තිබුණි. එම නොපියවන ලද කාලය මාස 01 සිට අවුරුදු 04 මාස 03 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. ඒ අනුව අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම පිළිබඳ පාලනය දුර්වල වී තිබුණි.	විවිධ ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන මෙහි සඳහන් අත්තිකාරම් මුදල් පියවීමේ කටයුතුවල ප්‍රමාදයන් සිදුවී ඇති අතර, ඉදිරි කෙටි කාලයක් ඇතුළත මෙම සියලු අත්තිකාරම් පියවීමේ කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා කිරීම් සිදුකරනු ලැබේ.	අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම පිළිබඳ පාලනය කාර්යක්ෂම කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2012 ජූලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ	සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් 2012 වර්ෂයට පෙර	සංස්ථාවේ එළුවන්කුලම වතුයාය පිහිටා අදියර I හා II ඉඩම්වල හා සුදුවතුර-ආර ඉඩමේ මැනුම් කටයුතු අවසන් කර පුත්තලම ආච්චිගේවත්ත වතුයාය හා කමන්දළුව වතුයාය පිහිටි ඉඩම් සඳහා ද මැනුම් නියෝග නිකුත් කර ඇත. සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරා ගැනීම සම්පූර්ණ කළයුතු සංස්ථාවේ මුළු ඉඩම් සංඛ්‍යාව 08 කි. මිනින්දෝරු දෙපාර්තමේන්තු	කාරක සභා තීරණ පරිදි නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

		අක්කර 2,367 ක් සහ 2012 වර්ෂයෙන් පසුව ලබාදුන් අක්කර 8,959 ක් වූ කජු වගා කරන ඉඩම් අක්කර 11,326 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.	ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20.218 කි. පවතින මූල්‍ය තත්ත්වය සලකා බලා ඉහත මුළු පිරිවැයෙන් සංස්ථාවේ 2025 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් රු.මිලියන 2.00 ක් වැය කිරීමේ හැකියාවක් පවතී. තවදුරටත් අවශ්‍ය වී පවතින රු.මිලියන 18.218 ක ප්‍රතිපාදන සඳහා ලිපියක් විෂයභාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එසේම ඉඩම් කොමසාරිස් ජනරාල් සතු ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩම් පිළිබඳ වාර්තාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර ඇති අතර, එමඟින් වෙල්ලන්කුලම හා පුනරින් වතුයායන් මැනුම් කටයුතු කිරීම සඳහා මැනුම් නියෝග ඉදිරිපත් කරන ලෙසට මාන්තෙයි (බටහිර) සහ පුනරින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම්දෙන ලෙසට ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්ෂය තුළදී අදාල මැනුම් කටයුතු සිදුකරනු ඇත.	
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය	විගණන ගාස්තු ඉන්වොයිස් පත්‍රයේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවා බේරුම් කළයුතු වුවත් 2024 මාර්තු 26 සහ 2024 නොවැම්බර් 27 දින නිකුත් කරන ලද විගණන ගාස්තු ඉන්වොයිස් සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් විගණන ගාස්තුව රු.1,331,040ක් ගෙවා බේරුම් කර නොතිබුණි.	සංස්ථාවේ දැනට පවතින මූල්‍ය තත්ත්වය මත විගණන ගාස්තු ගෙවීම ප්‍රමාද වී ඇති අතර මෙම වර්ෂය තුලදි 2023 දක්වා හිඟ විගණන ගාස්තුව රු.1,331,040ක මුදල ගෙවීමට කටයුතු කරනු ඇත.	හිඟ විගණන ගාස්තු නොපමාව නිරවුල් කළ යුතුය.
(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 66	මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, විගණකාධිපතිට ද පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්	එකඟ වෙමි. පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පූර්ව වශයෙන් පැවති සමාලෝචනයේදී මූල්‍ය ප්‍රකාශනවල පැවති තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමට සැලකිය යුතු කාලයක් ගත වූ බැවින් මෙහි සඳහන් පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමේදී ප්‍රමාදයක් සිදුවිය. කෙසේ නමුත්, ඉදිරි වර්ෂයේ සිට	නියමිත කාලසීමාව තුළදී ගිණුම් වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය.

	ඡේදය	සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2025 අප්‍රේල් 11 දින දිය.	නියමිත කාලසීමාව තුළදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ඈ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුනි 28 දිනැති අංක MF/CG/02(Cir) දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ, අංක 09 ඡේදය	වත්කම් හඳුනාගැනීම හා කළමනාකරණය කිරීමේ කටයුතු වලදී එම වත්කම් සඳහා වර්ගීකරණ කේතයන් හඳුන්වා දී තිබිය යුතු නමුත් සංස්ථාව විසින් එලෙස කේත හඳුන්වාදීමක් සිදු කර නොතිබුණි.	2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී නැදගමුව හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථාන, සංස්ථාවේ අලෙවිසැල් 05 හා පුත්තලම ප්‍රාදේශීය කාර්යාලයේ හැර සංස්ථා ප්‍රධාන කාර්යාලය ද ඇතුළුව අනෙකුත් සියලුම වතුයායන් හා ප්‍රාදේශීය කාර්යාල සඳහා වත්කම් වර්ගීකරණ කේතයන් හඳුන්වා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට සමගාමීව දැනට වත්කම් කේත හඳුන්වා දී නොමැති රාජකාරි පරිශ්‍ර සඳහා ද කේත හඳුන්වාදීමේ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	ආයතනයේ වත්කම් කේත ගත කිරීමට කඩිනමින් පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,845,266 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අලාභය රු.5,020,580 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,865,846 ක ලාභයේ වැඩි වීමක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම, පුනරාවර්තන ප්‍රදාන , වෙනත් ආදායම්වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සංස්ථාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම වතුයායේ 2000 වර්ෂයේදී රු.482,874 වියදමක් දරා වගා කරන ලද තේක්ක පැළ 2024 වර්ෂය වනවිට දැව ලබා ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය වී ඇති අතර එහි ඇති ගස් ප්‍රමාණය 4,253ක් පමණ වේ. එහි තක්සේරු අගය රු.244,000,000ක් ලෙස තක්සේරු කලද වතුයායේ නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති හෙයින් එම ගස්වල	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් ද ලබා ගනිමින් මෙහි සඳහන් එළුවන්කුලම වතුයායේ පවතින තේක්ක ගස් 4,253 ක ප්‍රමාණය තක්සේරු කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, ඒ අනුව 2023.03.27 වන දිනට එම තක්සේරු අගය රු.මිලියන 244.337 කි. කෙසේ නමුත් එළුවන්කුලම වතුයායේ නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති හෙයින් එම තේක්ක ගස්වල තක්සේරු වටිනාකම සංස්ථාවේ ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමේ හැකියාවක්	එළුවන්කුලම වතුයායේ නීතිමය අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කරගැනීමට කටයුතු කළ යුතුය.

	වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට ගැනීමට නොහැකි වී නොතිබුණි. තවද,එම ගස් මුදල් කරගැනීමෙන් සංස්ථාවට ලබාගත හැකිව තිබුණු මුල්‍ය වාසි අත්පත් කරගැනීමට නොහැකි වී තිබුණි.	නොමැත. දැනට එළුවන්කුලම වතුයායේ මැනීම් කටයුතු ද අවසන් කර ඇති අතර, ඒ අනුව වතුයායේ නීතිමය අයිතිය පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ වූ වහාම මීට අදාල ගැලපීම් ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ආ)	පුත්තලම, කමන්දළුව හා අම්පාර හාඩි වතුවල පිහිටි පොල්ගස් සංඛ්‍යාව 4,184 ක් වූ අතර, ඒවා නොමේරූ ගස් 1,147, ඵලදා ලබන ගස් 2,391 ක් හා කනාටු ගස් 646 කින් සමන්විත වී තිබුණි. 2024 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 46,032ක් වී තිබුණු අතර එම ඵලදාවේ විකුණුම් වටිනාකම රු.3,210,300 ක් වීය. ඒ අනුව ඵලදාව ලබන ගසක වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි 19 ක් වී තිබුණි. ඵලදාව වැඩිකර ගැනීමට පොල් ගස් නඩත්තු කිරීම,පොහොර යෙදීම දුර්වල වීම සහ කනාටු පොල්ගස් 491 ක් ඉවත් කිරීම ආදී කටයුතු සිදු කර නොතිබුණි.	එකඟ වෙමි. පොල් ඵලදාව අඩු වීමට හේතු වූයේ පොල් ගස් සඳහා යෙදිය යුතු පොහොර නිසි ලෙස යෙදවීම සිදු නොවූ බැවිනි.තව ද කාළගුණික තත්ත්වය ද මේ ඵලදාව අඩුවීමට හේතු විය. නමුත් මේ වන විට එම පොහොර නිසි ලෙස යෙදවීම සිදු කරන ලද අතර එමගින් ඉදිරියේදි පොල් අස්වැන්නේ ඉහළ යාමක් අපේක්ෂා කළ හැකිය. කණාටු පොල් ගස් 491 ක් ඉවත් කිරීමට අදාලව සියලු ක්‍රියාමාර්ග ගෙන පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් අදාල පනත ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය ලැබූ පසු එම ගස් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	පොල් ඵලදාව වර්ධනය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 70,000 ක් පමණ කජු වගාවන් පවතින අතර වර්ෂයකට මෙ.ටොන් 100,000 ක් හා 120,000 ක අතර ප්‍රමාණයක් කජු පුහුලන් අපතයක් හා කජු නිෂ්පාදනයෙන් පසු සියයට 75 ක කජු ලෙලි අපතයක් ලෙස එනම් දළ වශයෙන් මෙ.ටොන් 59.415 ඉවත් කරන බව සංස්ථාවේ දත්ත අනුව පෙන්වා දී තිබුනද මෙම අපතයන්ගෙන් සිදු කල හැකි කර්මාන්තයන් සොයා බලා ඒ පිලිබඳව ගත හැකි සුදුසු පියවරයන් ගෙන නොතිබුණි.	කජු අස්වැන්න එකතු කිරීම සිදුවන්නේ කජු පුහුලම බිම වැටීමෙන් පසුවයි. එයට හේතු වනුයේ කජු ඇටයේ පූර්ණ පරිනතිය ඇති බවට සලකන්නේ කජු පුහුලම බිම වැටීමෙන් පසුව වීමයි. කජු පුහුලම බිම වැටුණු පසු ඉතා කඩිනමින් පැය 24 ක් තුල පුහුලම තුළ ඇති රසායනික ද්‍රව්‍ය වායුගෝලයේ වාතය සමඟ ප්‍රතික්‍රියා කර ෆීනෝලික සංසටක ඇතිවීම මඟින් අතුරු නිෂ්පාදන සිදු කිරීම අපහසු වේ. තව ද ලංකාවේ කජු අස්වැන්න පවතින කාලසීමාවේදි ඉදුණු කජු පුහුලන් වන සතුන්ගේ ආහාරයට බවට පත්වීම නිසා සමස්ථ කජු පුහුලන් ඵලදාවම යම් කර්මාන්තයක් සඳහා යොදා ගැනීමට නොහැකි අතර, සුළු ප්‍රමාණයක් පමණක් ආරක්ෂිතව නෙලීම හා සීත ගබඩා කිරීම මගින් අගය එකතු කළ නිෂ්පාදන සඳහා භාවිතා කළ හැකිය. කජු ලෙලි මගින් තෙල් ලබා ගැනීමේ කාර්යය නවතාලීමට සිදුවූයේ ඒ සඳහා ඉල්ලුමක් නොමැති වීම නිසාවෙනි. ඒ සඳහා භාවිතා කරන ලද යන්ත්‍රය නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවති. කජු පුහුලන් මගින් වයින් හා විනාකිරි නිෂ්පාදනය සඳහා කාර්මික තාක්ෂණික ආයතනය මගින් සංස්ථා නිළධාරීන් සිවුදෙනෙකු	වයින් හා එතිල් ඇල්කොහොල් නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන සංවර්ධනයට කටයුතු කළ යුතුය.

		පුහුණු කළ අතර කාර්මික තාක්ෂණික ආයතනය සමඟ ඒකාබද්ධව ශක්‍යතා අධ්‍යනයකින් අනතුරුව එම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් සකස් කරමින් පවති.	
(ඈ)	නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින එකතු වටිනාකම රු.1,494,764ක් වූ විදුලිජනක යන්ත්‍රය (Generator),බොයිලේරුව (Boiler),කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුව (Boiler) අක්‍රීය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින කජු පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී තිබීම හේතුවෙන් ලෙලි කජු තැම්බීමකට (boil) ලක්කර සියයට 90 ත් 95 ත් අතර ප්‍රමාණයෙන් ලබා ගත හැකිව තිබුණු නිෂ්පාදන ඵලදායිතාවය, කජු පලුදු වීම හේතුවෙන් සියයට 70 ත් 80 ත් අතර ප්‍රමාණයක් දක්වා පහත වැටී තිබුණි. ඒ හේතුවෙන් කජු මද විකිණීමෙන් ලබාගත හැකිව තිබුණු ආදායම සියයට 15 ත් 20 ත් අතර ප්‍රමාණයකින් අහිමි වී තිබුණි.	වත්කම් අපහරණය සඳහා නිර්දේශ ලබා ගැනීමට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු ද ඇතුළත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇත. ඒ අනුව අදාල කමිටුවේ නිර්දේශවලට අනුව අදාල වත්කම්වල අපහරණ කටයුතු සිදුකරනු ලැබේ. වර්තමානයේ සංස්ථාව විසින් අනුගමනය කරන ලබන පිරිසැකසුම් ක්‍රමවේදයට අනුව සංස්ථාව වෙත පැමිණෙන පාරිභෝගිකයින් අපේක්ෂා කරනු ලබන කජුවල රසය හා ආවේණික වර්ණය එලෙසම තබාගත හැකිය. සංස්ථාව මඟින් වර්තමානයේදී කජු කැපීමේ යන්ත්‍ර මඟින් කජු කැපීම සිදු කරනු ලබන අතර, එමඟින් කජු කැබලි හා පියලි වීම අවම කර ගැනීමේ හැකියාව පවතී. කෙසේ වෙතත් බොයිලේරුව මඟින් කජු නිෂ්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණික කමිටුවක් මඟින් පූර්ණ අධ්‍යයනයක් සිදු කර සාපේක්ෂ වාසි සහගත ක්‍රමය ඉදිරියේදී අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.	නිෂ්කාර්ය වත්කම් අපහරණය කිරීමට හෝ භාවිතයට ගත හැකි ලෙස අලුත්වැඩියා කළ යුතුය.
(ඉ)	උක්, බඩඉරිඟු,කජු,ගම්මිරිස්,කුරුඳු, කරාබුනැටි,බුලත් ඇතුලු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී රු.19,250,752ක මුදලක් වෙන් කර නිල නිවාස 07ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස සංස්ථාව විසින් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි.තවද දඹුල්ල වාණිජ තවාන් භූමියේ රු.2,236,080ක් සහ මොණරාගල හිදිකිවුල භූමියේ රු.942,754 ක් වැයකොට ඉදිකරන ලද ගොඩනැගිලි ප්‍රමිතියෙන් තොරව ඉදි කිරීම නිසා භාවිතයට ගත නොහැකි වී තිබීම හේතුවෙන් රජයේ මුදල් නිෂ්කාර්යව වියදම් කර ඇති බව නිරීක්ෂණය විය.	මේවනවිට අදාල අමාත්‍යාංශ ප්‍රතිපාදන භාවිතා කරමින් මිහින්තලේ, පුත්තලම, පූනරින් හා මහඔය යන ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද නිල නිවාස 04 හි එම කටයුතු නිම කර, අදාල නිල නිවාස දැනට භාවිතයට ගනු ලැබේ.එමෙන්ම සංස්ථාව මඟින් මීට පෙර වගා කටයුතු පවත්වාගෙන යනු ලැබූ නාලන්ද වතුයායේ ඉදිකිරීමට සැලසුම් කරන ලද නිල නිවසේ පාදම පමණක් ඉදිකර තිබියදී එම වතුයාය පිහිටි ඉඩමේ හිමිකාරත්වය දරන ඇල්කඩුව වැවිලි සමාගම වෙත අදාල ඉඩම නැවත භාරදීමට කටයුතු කරන ලද බැවින් අදාල නිල නිවසේ ඉදිකිරීම් කටයුතු නවතාලීම සිදුකර ඇත. තවද, ඉතිරි නිල නිවාස 02 න්, සංස්ථාවේ දඹුල්ල වාණිජ තවාන් භූමියේ පවතින සියයට 75 ක පමණ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති නිල නිවසේ එම ඉදිකිරීම් කටයුතුවල පවතින බවට	අවසන් කර නොමැති නිවාස ඉදිකිරීම් කාර්යක්ෂමව නිම කර භාවිතයට ගත යුතුය. ප්‍රමිතියෙන් තොර ඉදි කිරීම් භාවිතයට සුදුසු අයුරින් සකස් කළ යුතුය.

		වාර්තා වී ඇති තාක්ෂණික දෝෂ මහහරවාගෙන අදාල ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්ත්වයකට පත්කර ගැනීම සම්බන්ධයෙන් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිවිල් ඉංජිනේරුවරයාගෙන් අදාල උපදෙස් ඉල්ලුම් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.එසේම දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට සැලසුම් කළ නමුත් මූලික ඉදිකිරීම් කටයුතු පමණක් සිදුකර ඇති මොනරාගල ප්‍රදේශයේ නිල නිවස සඳහා පවතින මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් එය තනිමහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට ප්‍රාදේශීය තාක්ෂණ නිලධාරීවරයෙකුගෙන් ඇස්තමේන්තුවක් ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර, එම ඇස්තමේන්තුව ලැබුනු පසු ඒ අනුව අදාල ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	
(ඊ)	2024 වර්ෂය සඳහා කොන්ඩව්වි,පුත්තලම,හාඩ්,මාන්කර්නි හා සුදුවතුර ආර යන වතුයායන්වල වාර්ෂික කපු ඵලදාවේ මුළු වටිනාකම රු.8,276,438 ඉක්ම වූ මුළු නඩත්තු වියදම රු.29,453,821 ක් වූයෙන් අලාභය රු.21,177,383 ක් වී තිබූ අතර එළුවන්කුලම,කමන්දළුව,පුනරින්, වෙල්ලන්කුලම හා මහඔය යන වතුයායන්වල කපු ඵලදාවේ මුළු වටිනාකම රු.51,384,373ක් ද, මුළු නඩත්තු වියදම රු.37,160,015ක් වූයෙන් ලාභය රු.14,402,960ක් වී තිබුණි.ඒ අනුව, වතුයායන් අලාභ ලැබීමට හේතු සොයා බලා පිළියම් යොදා නොතිබුණි.	මෙහිදී කමන්දළුව, පුත්තලම, එළුවන්කුලම, මහඔය, වෙල්ලන්කුලම හා පුනරින් යන වතුයායන් ලාභදායීව පවත්වාගෙන ගොස් ඇති අතර, අනෙකුත් වතු ද ලාභදායී මට්ටමක පත්කර ගැනීම සඳහා 2025 වර්ෂයේදී විධිමත් සැලසුමකට අනුව කටයුතු කරගෙන යනු ලැබේ.	වතුයායන් අලාභ ලැබීමට හේතු සොයා බලා පිළියම් යෙදිය යුතුය.
(උ)	2024 වර්ෂයේ කපු වතුයායවල ඉලක්කගත අස්වැන්න හා එම වර්ෂයේදී ලැබූ ලෙලි කපු අස්වැන්න සැසඳීමේදී එම ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රතිශතය සියයට 66 ක් වී තිබුණි.	සමාලෝචිත වර්ෂයේදී මුළු අස්වනු ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය සියයට 66 ක් වේ.එසේම සමාලෝචිත වර්ෂයේදී පුනරින් වතුයායේ හා කොන්ඩව්වි වතුයායේ ලෙලි කපු අස්වනු ඉලක්ක ඉටුකරවා ගැනීමේ ප්‍රතිශත පිළිවෙලින් සියයට 83 ක් හා සියයට 23 කි. කෙසේ නමුත් අදාල වර්ෂයේ කමන්දළුව වතුයායේ ලෙලි කපු අස්වනු ඉලක්ක ඉටුකරවා ගැනීමේ ප්‍රතිශතය සියයට 154 ක ඉහළ අගයකින් යුක්ත වේ.	වතුයායන්වල ඉලක්කගත අස්වැන්න සාක්ෂාත් කර ගැනීමට පියවර ගත යුතුය.
(ඌ)	අනුරාධපුර දිස්ත්‍රික් ව්‍යාප්ති කාර්යාලය අනුරාධපුර නගරයේද, කපු පැළ තවාන මිහින්තලයේද පිහිටා තිබීම හේතුවෙන්	සංස්ථාවේ අනුරාධපුර ප්‍රදේශීය කාර්යාලයේ තාක්ෂණික නිපුණතාවය සහිත කාර්ය මණ්ඩලයක් හා ප්‍රමාණවත් ඉඩ පහසුකම්	සංස්ථාවේ සේවා සැපයීම හා භාණ්ඩ

	කජු පැළ ලබා ගත යුතු පාරිභෝගිකයින් අනුරාධපුර ව්‍යාප්ති කාර්යාලයට මුදල් ගෙවා කජු පැළ තවානට ගොස් කජු පැළ මිලදී ගැනීමට කි.මී. 14 ක් දුර යාමට හා ඒ සඳහා අතිරේක වියදමක් දැරිය යුතු බව නිරීක්ෂණය විය.	නොමැති නිසා පැළවල වගකීම හා ගුණාත්මකභාවය රැකගත හැකි සුදුසු ක්‍රමවේදයක් හඳුනා ගන්නා තෙක් මිහින්තලය තවානෙන් පැළ නිකුත් කිරීමට සිදු වේ. කෙසේ නමුත් ඉදිරියේදී පැළ මිලදී ගැනීම සිදුකරන පාරිභෝගිකයින් ඊට අදාල මුදල් බැංකුගත කර එම රිසිට්පත තවාන වෙත ඉදිරිපත් කර පැළ ලබා ගැනීම සඳහා ඉඩප්‍රස්ථාව ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම පිළිබඳ අධ්‍යයනය කරමින් සිටින අතර, ඒ අනුව ඉදිරි තීරණ ගැනීමට කටයුතු කරනු ලැබේ.	සැපයීම පාරිභෝගිකයාට පහසුවන ආකාරයෙන් කළ යුතුය.
(එ)	සංස්ථාව විසින් 2022, 2023 හා 2024 වර්ෂවලදී කොන්ඩච්චි වතුයායේ අක්කර 472 ක නව කජු පැළ වගාකර තිබුණි. ඒ අනුව කජු පැළ වගා කිරීමේ සාමාන්‍ය වර්ෂයකට අක්කර 157.33 ක් වීය. කජු පැළ වගා කිරීමේ කාර්යක්ෂමතාවය අනුව කජු පැළ වගාකර නොමැති නමුත් කජු පැළ වගාකල හැකි බිම් ප්‍රමාණය වූ අක්කර 3,078 ක කජු පැළ වගා කිරීම සඳහා වර්ෂ 19.5 ක් ගතවන බව නිරීක්ෂණය විය.	ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් මෙම කොන්ඩච්චි වතුයාය සංවර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. නමුත් කජු සංස්ථාවේ මූල්‍යමය තත්ත්වය හමුවේ කඩිනමින් වතුයාය සංවර්ධන කිරීමේ හැකියාවක් නොමැත. එබැවින් බාහිර පාර්ශවයන් සමඟ ඒකාබද්ධව මෙම භූමිය ක්‍රමවත්ව සංවර්ධනය කරමින් නව වගාව ඇතිකිරීමට කටයුතු කරනු ලැබේ.	කජු පැළ වගා කිරීමේ කටයුතු කාර්යක්ෂමව නිම කිරීමට පියවර ගත යුතුය.
(ඒ)	2024 වර්ෂයේදී කොන්ඩච්චි වතුයායේ සංස්ථාව පාලනය කරනු ලබන කොටසේ නව වගාව සඳහා අක්කර 340 ක භූමි ප්‍රමාණයක් එළිකර තිබුණද රෝපණය කිරීම සඳහා සුදුසු පැළ 23,800 ක් නොලැබීම හේතුවෙන් එම භූමි ප්‍රමාණයේ නව කජු පැළ වගාකර නොතිබුණි.	කොණ්ඩච්චි වතුයාය සංස්ථාව සතු නව කජු ප්‍රභේද වලින් පමණක් සිටුවීමට නියමිතය.එමඟින් ගොවීන් වෙත ගුණාත්මක කජු පැළ ලබා දීමේ ප්‍රවණතාවය ඉහළ දැමිය හැකිවේ.වතුයායේ බද්ධ කජු පැළ සිටුවීම ක්‍රමවත් වගා ක්‍රමයක් යටතේ සිදුකරන බැවින් අදාල වගා කොටස් සඳහා අවශ්‍ය බද්ධ කජු පැළ වර්ධන ප්‍රමාණවත් නොවීම මත 2024 වර්ෂයේ දී පැළ සිටුවීම සිදුනොකරන ලදි. කෙසේ නමුත් කොන්ඩච්චි වතුයායේ C හා E කොටස්වල නව ප්‍රභේදයන්ට ගැනෙන බද්ධ කජු පැළ සිටුවීමේ කටයුතු දැනටමත් අවසන් කර ඇත.	නව කජු පැළ වගා කිරීමේ කටයුතු කාර්යක්ෂම කළ යුතුය.
(ඔ)	කොන්ඩච්චි වතුයාය භූමිය කෙටිකාලීනව බදු දීම තුළින් බදුකරුවන් විසින් කෙටිකාලීන ඵලදාව ලබා ගැනීම සඳහා පමණක් භූමිය නඩත්තු කරන අතර ගස්වල මුල් ගැලවීම,වැටි දැමීම, සෝදා පාලුව වැළැක්වීම වැනි කාර්යයන් ඉටුකර නොතිබුණි. එකම භූමි ප්‍රදේශය වර්ෂ 2-3 ක් අතර කාලයක් එකම බදුකරුවකු වෙත ලබාදීම තුළින් වගා භූමිය නඩත්තු කිරීමෙන් සංස්ථාවට අත්පත් කර හැකි ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.එසේම එම වතුයාය	මෙවනවිට කොන්ඩච්චි වතුයායේ කෙටිකාලීන අතුරු භෝග වගාවන් සිදුකරනු ලබන බාහිර ගොවීන් මඟින් කජු පැළ හා වගා ක්ෂේත්‍රය මාස 06 ක පමණ කාල සීමාවක් නඩත්තු කිරීම සිදුකරනු ලබන අතර, එමඟින් කජු පැළ වගාව හා ක්ෂේත්‍රය ක්‍රමවත්ව නඩත්තුවකට ලක්වේ.දැනට නව ක්‍රමවේදයකට අනුව ද ගොවීන් කිහිපදෙනකුට අක්කර 90 ක භූමි කොටසක් නියමු ව්‍යාපෘතියක් ලෙස වාර්ෂිකව දීර්ඝ වන සේ ගිවිසුම්ගතව අතුරු භෝග වගා කටයුතු සඳහා ලබා දී ඇති අතර, ඉදිරියේ දී එහි සාර්ථකත්වයට අනුව මේ සඳහා මූල්‍ය ශක්තිය පවතින ගොවීන්	කෙටිකාලීනව බදු දීමේ කටයුතු හා අලි වැට ඉදි කිරීමේ කටයුතු නිම කිරීමට පියවර ගත යුතුය.

	විල්පත්තුව අභයභූමියට මායිම්ව තිබීම හේතුවෙන් වන අලින්ගෙන් ආක්‍රමණය තුළින් කජු වගාවට හානි වී තිබුණි. රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත වන අලින් වතුයායට පැමිණීම වැළැක්වීම සඳහා අලි වැටක් ඉදිකිරීම 2021 වර්ෂයේදී සැලසුම් කර තිබුණද 2024 දෙසැම්බර් වන විටද එම අලි වැට ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි.	හදුනා ගනිමින් අතුරු භෝග වගාවන් සඳහා වතුයායේ භූමි කොටස් ලබාදීමට කටයුතු කරනු ලැබේ. මෙහි සඳහන් කර ඇති පරිදි කොන්ඩච්චි වතුයාය වටා අලි වැටක් ඉදිකිරීම සඳහා දැනට පවතින මූල්‍යමය ප්‍රතිපාදනවලට අනුව සංශෝධිත ඇස්තමේන්තුවක් මේවනවිට ලැබී ඇති අතර, ඒ සඳහා නව ලංසු ඇගයීමේ කමිටුවක් පත්කිරීමෙන් අනතුරුව අදාල ඉදිරි කටයුතු සිදුකර මෙම අලිවැට ඉදිකිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.	
(ඕ)	මන්නාරම දිස්ත්‍රික්කයේ කොන්ඩච්චි වතුයායේ සිවිල් ආරක්ෂක බලකාය විසින් පාලනය කරන කොටසින් අක්කර 1,435 න් අක්කර 935 ක් පමණක් කජු වගාකර තිබුණු අතර අක්කර 500 ක ප්‍රදේශයක් භාවිතා නොකර කැලෑව වැවී නිෂ්කාර්යව තිබුණි.	මෙහි සඳහන් අක්කර 500 ක භූමි ප්‍රමාණය සංස්ථාව විසින් සිවිල් ආරක්ෂ දෙපාර්තමේන්තුව වෙත කජු වගා කිරීමේ කටයුතු සඳහා ලබා දී ඇත. මෙම භූමි කොටසේ මෙතෙක් කජු වගා කටයුතු ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අතර, ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලද පසු කඩිනම්ව අදාල ඉඩම් කොටසේ කජු වගා කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බවට එම නිලධාරීන් විසින් දැනුම්දී ඇත.	ආයතනය සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.
(ක)	කජු සංස්ථාව පවරා නොගත් ඉඩම් අතුරු බදු දීම කල නොහැකි වුවද කොන්ඩච්චි වතුයායේ නැගෙනහිර මායිමේ කල්ලාරු ඔය පිහිටි ප්‍රදේශයේ අක්කර 02 ක භූමි භාගයක් ගිවිසුමකින් තොරව විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර 2023 හා 2024 වර්ෂවලදී එම ඉදිකිරීම් සඳහා කිසිදු බදු හෝ කුලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය පිළිබඳව 2025.07.03 වන දින අදාල අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමකදී සාකච්ඡා කරන ලද අතර. එහිදී මෙම සංස්ථාව වෙත ප්‍රතිලාභ හිමිවන පරිදි අදාල ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා අදහස් හුවමාරු විය.ඒ අනුව අදාල තීරණ සංස්ථාව වෙත දැනුම්දුන් පසු ඊට අනුරූපව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත වේ.	බදු හෝ කුලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ග)	බාහිර පුද්ගලයින් විසින් සුදුවතුර ආර වතුයායෙන් අක්කර 155 ක් අත්පත් කරගෙන තිබුණු අතර වතුයායන් සංස්ථාව නමින් පවරාගෙන නොතිබීම හේතුවෙන් එම බාහිර පුද්ගලයින් ඉවත් කිරීම සඳහා නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගැනීමට හැකි වී නොතිබුණි. මේ අනුව රජය සතු ඉඩම්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.	සුදුවතුර ආර බීජ උද්‍යානයේ ඉඩම් අක්කර 155 ක් බාහිර පුද්ගලයින් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පොලිසියෙහි පැමිණිලි සිදු කර අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ව ද දැනුවත් කිරීමට කටයුතු කර ඇත. මෙම ඉඩමෙහි අයිතිය පවතින්නේ ප්‍රාදේශීය ලේකම් සතුව බැවින් ඊට අදාල මැදිහත්වීම් ඔවුන් විසින් සිදුකළයුතුව පවතින අතර, සංස්ථාව මඟින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කරනු ලැබේ.	අනවසර පදිංචි නැවැත්වීමට කටයුතු කළ යුතුය.

(ච)	2024 දෙසැම්බර් 31 වන විට සංස්ථාව පරිහරණය කරනු ලබන අක්කර 9,056 න් අක්කර 1,083 ක කජු වගාකල නොහැකි අතර අක්කර 7,973 ක කජු වගාකල හැකිව තිබුණි. ඉන් කජු ගස් වගාකල භූමි ප්‍රමාණය අක්කර 3,487 ක් වී තිබුණි. ඒ අනුව කජු වගා නොකර නිෂ්කාර්යව තිබෙන නමුත් වගාකල හැකි ඉඩම් ප්‍රමාණය අක්කර 4,486 ක් වී තිබුණු අතර සංස්ථාව භාවිතා කල හැකි ඉඩම් ප්‍රමාණයෙන් සියයට 56.2 ක් භාවිතා නොකර නිශ්කාර්ය වී තිබුණි.	වගා කළ හැකි ඉඩම් ප්‍රමාණයෙන් වගා නොකොට ඉතිරිව ඇති අක්කර 4,486 ක ප්‍රමාණය මෙම සංස්ථාවට හිමිවී ඇත්තේ යුධ වාතාවරණයෙන් පසු එනම්, 2014,2019 හා 2021 යන වර්ෂවලදී වේ. ඒ අනුව මෙම ඉඩම් සංස්ථාව වෙත ලැබී දැනට ගතවී ඇති උපරිම කාලය සැලකුව ද එය වර්ෂ 10 ක් වන අතර, එම කාලය තුළදී අක්කර 1,700 ක පමණ නව වගා කටයුතුවලින් අදාල වතුයායන් සංවර්ධනය කර ඇත.පවතින භාණ්ඩ හා සේවාවල ඉහළ මිල හේතුවෙන් සංවර්ධනය සඳහා ඉතා ඉහළ පිරිවැයක් වැයවන බැවින් ඒ අනුව වසරකට සංවර්ධනය කළ හැකි ඉඩම් ප්‍රමාණය සීමාසහිත වී ඇත.එසේ වුව ද ඉදිරියේදී මෙම ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් දැනටමත් සකස් කර ඇත.	ඉඩම් සංවර්ධන කටයුතු කාර්යක්ෂමව සිදුකොට ඵලදායීව සම්පත් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.
(ඡ)	සංස්ථාව විසින් බද්ධ හා බීජ කජු වගාකරන ලද අක්කර 3,487 න් අක්කර 3,410 ක් ඵලදාව ලබන ඉඩම් වී තිබුණු අතර ඵලදාව ලබන ගස් ප්‍රමාණය 48,613 ක් වී තිබුණි. අක්කරයකට වගාකල හැකි බද්ධ කජු ගස් ගණන 70 ක් ලෙස සංස්ථාව දක්වා තිබුණි. ඒ අනුව අක්කරයක් තුළ වගා කරන ලද ඵලදාව ලබන බද්ධ ගස්වල සාමාන්‍ය 14 ක් වී තිබුණි. ඒ අනුව සංස්ථාව කජු ගස් වගා කිරීමේදී අකාර්යක්ෂම වී තිබුණි.	2024.03.27 දින වනවිට සංස්ථාවේ වතුයායන්වල ඵලදාව සහිත කජු වගා අක්කර ගණන 1,696 කි. 2024 වර්ෂයේ වාර්තාවලට අනුව ඵලදාව සහිත කජු ගස් ගණන 55,724 කි. මේ අනුව අක්කරයක පවතින සාමාන්‍ය ගස් ගණන ආසන්න වශයෙන් 33 කි. මෙම සංස්ථාවේ කමන්දළුව, වෙල්ලන්කුලම, පුනරින් වැනි වතුයායන්හි බහුලව පවතින්නේ අක්කරයකට පැළ 40 බැගින් සිටුවන ලද බීජ කජු වගාවන් වන අතර, කොණ්ඩච්චි වතුයායේ ඇතැම් කොටස්වල අක්කරයකට පැළ 50 බැගින් වගා කරන ලද ඉඩම් කොටස් ද සැලකියයුතු ප්‍රමාණයක් පවතී. මෙම තත්ත්වය මත අක්කරයකට කජු පැළ 39 ක් පමණ පැවතීම ප්‍රායෝගික වේ.	කජු වගා කිරීම කාර්යක්ෂම කළ යුතුය.
(ට)	සංස්ථාව විසින් ඉඩම් අක්කරයක් තුළ වගාකල හැකි බද්ධ කජු ගස් ගණන 70 ක් ලෙස දක්වා තිබුණි. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 05 ක් තුළ අලුතින් වගා කරන ලද කජු පැළ සංඛ්‍යාව 68,215 ක් වී තිබුණු අතර භූමි ප්‍රමාණය අක්කර 1,161 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂයකදී අලුතින් වගා කරන කජු පැළ සංඛ්‍යාවේ සාමාන්‍ය 13,643 ක් වී තිබුණු අතර (68,215/5 = 13,643) සංවර්ධනය කළහැකි අක්කර 4,486 හි බද්ධ කජු පැළ 314,020 ක් (4,486×70) වගාකල හැකිව තිබුණු අතර නව කජු පැළ වගාකරන ලද භූමි ප්‍රමාණයේ වාර්ෂික සාමාන්‍ය අක්කර 232.2	සංස්ථාවේ වතුයායන්වල දැනට වගා කටයුතු ආරම්භ නොකොට ඉතිරිව පවතින අක්කර 4486 ක ප්‍රමාණය සංවර්ධනය කිරීමට ගතවන කාලය තීරණය වන්නේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ධාරිතාවය (නිලධාරීන් ප්‍රමාණය, කම්කරුවන් ප්‍රමාණය, යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණය), ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය සහ පවතින ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීම (අලිවැට ඉදිකිරීම/ ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීම/ හිඟ බදු මුදල් ගෙවීම/ඉඩම්වල මැණුම් කටයුතු සිදුකිරීම/සංගණන කටයුතු) යන සාධක මත වේ.	කජු වගා කිරීම කාර්යක්ෂම කර ඵලදායීව සම්පත් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.

	(1,161/5=232.2) ක් වී තිබුණි. ඒ අනුව වගා නොකළ සහ සංවර්ධනය කළ හැකි අක්කර 4,486 හි නව කජු වගා කිරීම් සඳහා වර්ෂ 19 ක් ගතවන බව නිරීක්ෂණය විය.		
(ඩ)	සංස්ථාවේ කජු ගස් සඳහා 2018 වර්ෂයේ සිට 2024 නොවැම්බර් දක්වා කාලය තුළ පොහොර යොදා නොතිබුණු අතර 2024 දෙසැම්බර් මාසයේදී එළුවන්කුලම, පුත්තලම සහ හාඩි වතුයායන් සඳහා පොහොර යූරියා කි.ග්‍රෑම්.10,850 ක්, එම්.ඕ.පී කි.ග්‍රෑම් 6,000 ක්, ඊ.ආර්.පී කි.ග්‍රෑ.13,000 ක් ලෙස එකතුව කි.ග්‍රෑ.29,850 ක් ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් අවසාන වනවිට එම පොහොර තොගයෙන් කජු ගස් 9,340 ක් සඳහා පොහොර කි.ග්‍රෑම් 12,950 ක් පමණක් යොදා තිබූ අතර ඉතිරි කි.ග්‍රෑම් 16,900ක පොහොර ප්‍රමාණය වතුයායන්හි ගබඩාවල භාවිතයෙන් තොරව ගබඩා කර තිබුණි. කජු ගස් වලට නියමිත කාල සීමාව තුළදී පොහොර යෙදීමට අපොහොසත් වීම කජු ඵලදාව අඩු වීමට බලපා තිබුණි.	ප්‍රායෝගික තත්ත්වයන් මත ප්‍රසම්පාදන කටයුතුවල සිදුවූ සංස්ථාවට පාලනය කළ නොහැකි ප්‍රමාදයන් හේතුකොටගෙන කජු පොහොර සැපයීම් ද ප්‍රමාද විය. ඒ අනුව වතුයායන් වෙත පොහොර ප්‍රවාහනය කරන ලද්දේ 2024.12.19 වන දිනදී වේ. මෙම තත්ත්වය මත මිලදී ගත් මුළු පොහොර සියල්ල 2024.12.31 දිනට ප්‍රථම යොදා අවසන් කිරීම සිදු කල නොහැකි වූ අතර, අදාල පොහොර 2025 වර්ෂයේ මුල් කාර්තුව තුළදී වගාවන්ට යෙදීමේ කටයුතු අවසන් කර ඇත.	නියමිත කාලවලදී පොහොර යෙදීම කළ යුතුය.
(ණ)	රජය විසින් ප්‍රතිපත්තිමය සැලසුම් සැකසීමේදී හා ක්ෂේත්‍රය සඳහා විවිධ වූ අනුග්‍රහයන් ලබා දීමේදී රාජ්‍ය යාන්ත්‍රණය තුළ වූ විවිධ ආයතන සඳහා නිවැරදි තොරතුරු ලබා දීමේ අරමුණින් කජු ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා කජු සංස්ථාව 2024 පෙබරවාරි 20 දින අංක SLCC/EXT/02/11/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකය මගින් 558 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර තිබුණි. නමුත් 2024 දෙසැම්බර් අවසන් වන විටද ශ්‍රී ලංකාව තුළ සිටින කජු ක්ෂේත්‍රයේ නියැලුණු ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු රැස් කිරීම අවසන් කර නොතිබුණි.	කජු ක්ෂේත්‍රයේ නියැලෙන ව්‍යවසායකයින් සංස්ථාවේ ලියාපදිංචි කර ගැනීම සඳහා ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීමක් මඟින් පොදුවේ අදාල පාර්ශව දැනුවත් කිරීම් සිදුකරනු ලැබූව ද ඒ සඳහා එම පාර්ශවයන්ගෙන් ප්‍රතිචාර නොලැබිණි.ඒ අනුව සංස්ථාවේ ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය අදාල ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු සපයා ගැනීමේ කාර්යය හැකි උපරිම ආකාරයෙන් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබන අතර, ඒ සඳහා දැනට අදාල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු තොරතුරු ද එක් රැස්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	කජු කර්මාන්තයට අදාල තොරතුරු රැස්කර ගැනීම කඩිනම් කළ යුතුය.
(ත)	කොන්ඩව්වි වතුයායේ ප්‍රතිෂ්ඨාපන කාර්යයයේදී ගොඩනැගිලි සඳහා වතුයායේ ගස් කපා දැව ලබාගෙන තිබුණි.එම ගස් කැපීමේදී සංරක්ෂිත දැව වශයෙන් නම් කර ඇති හා නිෂ්පාදන කටයුතු සඳහා අවසරයකින් තොරව	මේ යටතේ දක්වා ඇති විගණන නිරීක්ෂණවල අන්තර්ගත කරුණු මත පදනම්ව අදාල නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් මේ වනවිට ක්‍රියාත්මක බැවින් එහි ප්‍රතිඵල අනුව ඉදිරියේදී තීරණ ගැනීමට නියමිතව පවතී. ඒ අනුව අදාල පරීක්ෂණයට සම්බන්ධ	රජය විසින් පනවා තිබෙන නීති රීති අනුව කටයුතු කළ යුතුය.

	භාවිතා කළ නොහැකි කළුවර,කළු මැදිරිය වැනි දැව,පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/2010 හා 2010 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයට පටහැනිව සහ බලධාරීන්ගේ අනුමැතියකින් තොරව සංස්ථාවේ නිළධාරීන්ගේ අභිමතය පරිදි දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා අනෙකුත් අදාළ නීතිරීති උල්ලංඝනය කර ඉරුම් සිදුකර දැව ලබාගෙන තිබුණි.	කරුණුවලට අදාලව තොරතුරු ඉදිරිපත් කිරීම නීතිමය වශයෙන් ගැටළුසහගත බැවින් එම පරීක්ෂණය අවසන් වූ පසු මෙම නිරීක්ෂණවලට අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමේ හැකියාව පවතී.	
(ද)	කපු පැළ තවාන්වල 2024 වර්ෂයේ ඉලක්ක හා ඉලක්ක ළඟාකර ගැනීම පරීක්ෂා කිරීමේදී 2024 වර්ෂය අවසානයට සියලුම සාර්ථක බද්ධ කපු පැළ තවානෙන් බැහැරව වගා භූමිය වෙත නිකුත් කළ යුතු වුවත් දුර්වල කළමණාකරණය හේතුවෙන් මහියංගණය හා හාඩි/කිරාන් කපු තවාන්වල එකදු කපු පැළයක්වත් ක්ෂේත්‍රයට මුදා හැරීමට අපොහොසත්ව තිබුණි.තවද, මහියංගණය හා මංගලගම කපු පැළ තවාන්වල කපු පැළ මියයෑමේ ප්‍රතිශතය සියයට 15 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.	2024.12.31 දින වනවිට සමස්ත පැළ තවාන්වල ඉතිරිව පැවති සාර්ථක බද්ධ කපු පැළ ප්‍රමාණය 159,379 කි. ඒ වනවිට මහියංගන පැළ තවානේ සාර්ථක බද්ධ පැළ 8,538 ක් ද, හාඩි තවානේ බද්ධ කපු පැළ 23,879 ක් ද ඉතිරිව පැවතිනි. ඒ අනුව උක්ත තවාන්වලින් 2024.12.31 දිනට පෙර පැළ මුදා හැරීම සඳහා කිසිදු බාධාවක්ව නොපැවතුනු නමුත් ප්‍රායෝගික තත්ත්වයන් මත සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිකුත් කළයුතු පැළ ගොවීන් විසින් රැගෙන යාමේදී ප්‍රමාදයක් සිදුවී ඇත.එසේම මෙහි සඳහන් පරිදි මහියංගන හා මංගලගම තවාන්වල පැළ මියයාම් ප්‍රතිශතය ඉහළ ගොස් ඇත්තේ දිලීර රෝග ආසාදන පැතිරයාම හේතුවෙන් වන අතර, කෙසේ නමුත් හැකිතාක් දුරට එම තත්ත්වයන් පාලනය කරගනිමින් පැළ නිෂ්පාදන කටයුතු සම්පූර්ණ කර ඇත.	සැලසුම් කල පරිදි නව කපු වගාව ස්ථාපිත කළ යුතුය.
(න)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට කපු වගා කර තිබෙන බිම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 3,487 ක එල දරන කපු ගස් සංඛ්‍යාව 55,724 ක් වේ. එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු.70,304,127ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කපු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.	පසුගිය සෑම වර්ෂයකම කපු ගස් සංගණන කටයුතු සිදුකර ඇතත්,ඒ ඒ වතු වල පවතින වාර්ෂික ආදායම් වියදම් තත්ත්වයන් මත කපු ගස් අංකනය කිරීම සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වන බැවින් එම කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.කෙසේ නමුත් මේ වන විට පුනරීන් හා වෙල්ලන්කුලම යන වතුයායන්වල පවතින කපු ගස් අංකනය කර ගස් රෙජිස්ටර් සෑදීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, ඉන් අනතුරුව පවතින මුදල් ප්‍රතිපාදනවලට අනුව ඉතිරි වතුයායන්වල ද ගස් අංකන හා ගස් රෙජිස්ටර් සෑදීමේ කටයුතු සිදු කිරීමට නියමිතව පවතී.	කපු ගස් සංගණනයක් කර ඒවා අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයකට ඇතුළත් කළ යුතුය.
(ප)	ආයතනයේ දේපල,පිරියත සහ උපකරණ කේත ගත නොකර තිබීම හේතුවෙන් වත්කම් වෙන් වෙන්ව හඳුනා ගත නොහැකි විය. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 285,684,612	සංස්ථාවේ 2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී නැදගමුව හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථාන, සංස්ථාවේ අලෙවිසැල් 05 හා පුත්තලම ප්‍රාදේශීය කාර්යාලයේ හැර සංස්ථා ප්‍රධාන කාර්යාලය ද ඇතුළුව අනෙකුත්	ආයතනයේ දේපල,පිරියත සහ උපකරණ කේත ගත කළ යුතුය.

	ක් වූ දේපල,පිරියත සහ උපකරණවල අගය හා පැවැත්ම පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	සියලුම වතුයායන් හා ප්‍රාදේශීය කාර්යාල සඳහා වත්කම් වර්ගීකරණ කේතයන් හඳුන්වා දීමට කටයුතු කර ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේදී එනම්, 2025 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට සමගාමීව දැනට වත්කම් කේත හඳුන්වා දී නොමැති රාජකාරී පරිශ්‍ර සඳහා ද කේත හඳුන්වාදීමේ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	
(ඛ)	ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නියෝජ්‍ය සභාපතිවරිය ධුරයෙන් ඉවත් කර තිබියදීත් 2024 ඔක්තෝම්බර් 27 දක්වා කාලය තුළ සංස්ථාවේ පාලනයකින් තොරව රියදුරුගේ සේවය සහිතව ඇය වෙත ලබාදී තිබූ කැබ් රථය කි.මීටර 2,069 ක් පෞද්ගලික කාර්යයන් සඳහා ධාවනය කර තිබුණි.	මෙම හිටපු නියෝජ්‍ය සභාපතිනියව අදාල තනතුරෙන් 2024.10.04 වන දින සිට ඉවත් කර ඇති බවට විෂයභාර අමාත්‍යාංශ මඟින් විධිමත්ව සංස්ථාව වෙත දැනුම්දීමට කටයුතු කරන ලැබ ඇත්තේ 2024.11.12 දිනැති ලිපියකින් වන බැවින්,අනුයුක්ත කළ වාහනවල ධාවන තොරතුරු දෛනිකව සටහන් කරනු ලබන ලේඛනයට අනුව 2024.10.04 වන දින සිට 2024.10.28 දින තෙක් ඇය විසින් සංස්ථාවේ අංක PF – 9521 දරණ වාහනය (ඩබල් කැබ් රථය) ධාවන කටයුතු සඳහා භාවිතා කර ඇත. කෙසේ නමුත් අදාල කාලසීමාව සඳහා එම ධාවන කටයුතු වෙනුවෙන් ඇය වෙත ඉන්ධන දීමනා ගෙවීමක් හෝ වෙනත් කිසිදු ගෙවීමක් සංස්ථාව මඟින් සිදුකර නොමැත.	රාජකාරියෙන් ඉවත්ව සිටි කාලය තුල ඩබල් කැබ් රථය භාවිතා කිරීමට අදාල පිරිවැය අය කර ගත යුතුය.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් රු.13,845,266 ක ලාභයක් ඉපයීමට, පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායම රු.86,160,509 කින් වර්ධනය වී පැවතීම ප්‍රධාන වශයෙන් හේතුවී ඇති බව නිරීක්ෂණය විය. ආසන්නතම වර්ෂ 05 තුළ එනම් 2020 සිට 2024 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘෂ්‍ය අලාභය රු.148,049,770 සිට රු.102,312,533 දක්වා පරාසයක් වී තිබුණි. මේ අනුව අඛණ්ඩව අලාභ ලැබීම,කාර්යමණ්ඩල පුරප්පාඩු හා පවත්නා කජු වතු උපරීම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය.	අහිතකර තත්ත්වය වළක්වා ගැනීම සඳහා ආදායම් විවිධාංගීකරණයට අවශ්‍ය නෛතික පසුබිම සකස් කර ගැනීමටත්, දිගුකාලීන පර්යේෂණ කටයුතු මඟින් කාලගුණික විපර්යාසයන් තුළදී අස්වනු විචලතාවය අවම ප්‍රභේද හඳුන්වාදීමට හා ප්‍රචාරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.	සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කළ යුතුය.

3.3 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කොන්ඩච්චි වතුයාය ප්‍රතිෂ්ඨාපනය සහ ජල සම්පාදන පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2021 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයෙන් ලද රු. 225,000,000ක මුදල් උපයෝජනය කිරීමේ දුර්වලතාවය හේතුවෙන් 2021,2022,2023 හා 2024 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.මිලියන 168 ක්, රු.මිලියන 146 ක්, රු.මිලියන 132 ක් සහ රු.මිලියන 62 ක් රජයේ මුදල් ඌන උපයෝජිතව ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට කොන්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපන සඳහා ලැබුණු මුදල්වලින් ඉතිරිය ද ඇතුළුව ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ පැවතී රු.මිලියන 101.40 ක ශේෂය සහ 2024 වර්ෂයේ වියදම ඉක්මවූ අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.	කොන්ඩච්චි වතුයාය ප්‍රතිෂ්ඨාපනය සහ ජල සම්පාදන පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2021 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයෙන් ලද රු.මිලියන 225 ක මුදල ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර කොන්ඩච්චි වතුයායේ අවශ්‍යතාවයන් අනුව මේ දක්වා මුදල් යෙදවූ අතර, එම මුදලින් 2025.06.30 වන විට පවතින ශේෂය රු. මිලියන 45.35 ක අගයක් වන බැවින් ද, අදාල ව්‍යාපෘතියේ කටයුතු අනුව ඉදිරි කෙටිකාලසීමාවක් ඇතුළත එම මුදල් ද උපයෝජනය වන බැවින් අදාල මුදල් ශේෂය ආයෝජන සඳහා යෙදවීමේ හැකියාව ඉතා සීමිත වේ.	අතිරික්ත හා නිෂ්ක්‍රියව පවත්නා මුදල් උපරිම ප්‍රතිලාභ ලැබෙන ආකාරයට උපයෝජනය කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නැදගමුව හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානවල කජු පිරිසැකසුම් කිරීමේ කාර්යය සඳහා රු. 8,100,000ක් හා රු. 9,030,000 ක් වැයකර මිලදී ගත් කජු ඇසුරුම් යන්ත්‍රය හා කජු පිරිසැකසුම් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා මිලදී ගත් යන්ත්‍රය යන යන්ත්‍ර 02 2024 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කිරීමට නොහැකිව නිශ්කාර්යව තැබීම සම්බන්ධයෙන් පරීක්ෂා කර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම යන්ත්‍ර මිලදී ගැනීම්වලට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව පැවැත්වීමට නියමිත මූලික විමර්ශන කටයුතු භාරදීම සඳහා අමාත්‍යාංශයෙන් ලබාදී ඇති උපදෙස් මත රාජ්‍ය පරිපාලන විමර්ශන නිලධාරී සංවිතයෙන් සුදුසු නිලධාරියෙකු පත් කර ගැනීම සඳහා දිගින් දිගටම උත්සාහ දරනු ලැබූව ද ඒ සඳහා සම්බන්ධ කරගත් නිලධාරීන් කිසිවෙකු මූලික විමර්ශන කටයුතු භාර නොගන්නා බැවින් අදාල කාර්යය සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.	යන්ත්‍ර උපරිම ධාරිතාවෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් වතුයායන් සඳහා හෝ ලබාදී පාවිච්චි කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අක්කර 4,338ක් විශාල කොන්ඩච්චි වතුයායේ කාර්යයන් සඳහා වැඩ බලන වතු අධිකාරිවරයෙක්,එක් රියදුරෙක්, එක් මුරකරුවෙක් සහ එක් ක්ෂේත්‍ර සහකාරවරයෙක් ස්ථිර කාර්යය මණ්ඩලය	සංස්ථාවේ මූල්‍යමය තත්ත්වය යහපත් වූ වහාම අවශ්‍යතාවය පරිදි කොන්ඩච්චි වතුයායේ දැනට පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	අවශ්‍ය සේවකයන් බඳවා ගත යුතුය.

ලෙස අනුයුක්ත කර තිබුණු අතර විශාල වතු යායක් පාලනය කිරීම සඳහා එම සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ආ) කොන්ඩච්චි වතුයායේ මුර සංචාරයේ යෙදුණු 44 හැවිරිදි සේවකයෙකුට බදින ලද තුවක්කුවකින් වෙඩි වැදී 2024 ජුනි 15 දින මරණයට පත් වී එම මරණය සඳහා සංස්ථාව මගින් රු.260,000 ක වන්දියක්ද, 2024 ජූලි මාසයේදී චෙක්රෝල් මත (වසර 20 ක් සේවය කළ) සේවය කරමින් සිටියදී හෘදයාබාධයකින් මිය ගිය කම්කරුවෙකුගේ ඥාතීන් වෙත රු.90,000 ක්ද සංස්ථාවේ මුදලින් ගෙවා තිබුණි.සංස්ථාවේ වතුයායන්වල සේවය කරනු ලබන අවදානමට ලක්විය හැකි සේවකයින් සඳහා රක්ෂණ ආවරණය ක්‍රියාත්මක කර නොතිබුණි. සංස්ථාවේ පවතින මූල්‍ය ප්‍රතිපාදන මත මෑත කාලීනව වාහන රක්ෂණය හැර අනෙකුත් දේපළ හෝ සේවක රක්ෂණ ආවරණ ක්‍රම ක්‍රියාත්මක නොකළ අතර, මෙම විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් ද අවධානය යොමු කර මූල්‍ය ප්‍රතිපාදනවල තත්ත්වය ද සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී එම සේවක හා අනෙකුත් දේපළ රක්ෂණ ආවරණ ද සංස්ථාව වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. අවදානමට ලක්විය හැකි සේවකයින් සඳහා රක්ෂණ ආවරණය සැලසිය යුතුය.